# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/45 - 2022 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා - 2022.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ATU/LND/04/DO53.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/5/2019/HA/615.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බලකාවල ග්‍රාම නිලධාරි වසමේ බලකාවල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 77 පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම් :

**01. කැබලි අංක 984**
ඉඩමේ නම: ගවරබොක්ක *හෙවත්* ගවරගොඩහේන; ඉඩමේ විස්තර: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: බලකාවල පදිංචි පී. ඒ. එස්. පාඩිප්පෙරුම මයා; ප්‍රමාණය: හෙක්ටයාර 0.0068 වේ.

**02. කැබලි අංක 985**
ඉඩමේ නම: ගල්කැටියවත්ත *හෙවත්* බලකාවල චෛත්‍යානන්ද විහාරය *හෙවත්* බලකාවල සැනද වෙහෙර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ඉදිකරන ලද ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: පූජ්‍ය කොටපොල සීලරතන හිමි, විහාරාධිපති, සැනද වෙහෙර, බලකාවල; ප්‍රමාණය: හෙක්ටයාර 0.0219 වේ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023 පෙබරවාරි මස 15 දින පෙ.ව. 10.00 ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.02.08 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී

ඉඩම/පරවශතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියළු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 12-0175

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* LD/05/2006/පීසී/349.
*මගේ අංකය:* DSWA/LND/4/ACQUI/F1/28.

අංක 2209/77 හා 2021.01.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 ඒ පිටුවේ පළ කරන දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අගලබඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අ.ග.පි. 155 හි පිහිටි ඉඩම අත්පත් කර ගැනීමට අදාළව පළ කරන ලද දැන්වීම අවලංගු කරන ලද අතර, නව වන්දි පරීක්ෂණ ස්ථානය, දිනය හා වේලාව වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2023.03.20 දින පෙ.ව. 10.30 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2022 දෙසැම්බර් මස 05 වැනි දින,
වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 12-0176

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* LA/1783.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/17/2021/D/පොදු/iv.

2022.10.26 දින දරන අංක 2303/15 දරන ශ්‍රී ලංකා ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 21ඒ පිටුවේ සඳහන් "ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 24, 25 වැනි දින පෙ.ව. 10.00 ට තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2022 නොවැම්බර් මස 17, 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය" යන්න පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

"ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජනවාරි මස 25, 26 වැනි දින පෙ.ව. 10.00 ට වලිකාමම් උතුර තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි. තවද 2023 ජනවාරි මස 18, 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය."

ස. සිවශ්‍රී,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් උතුර,
තෙල්ලිප්පළේ.

2022 දෙසැම්බර් මස 05 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වලිකාමම් උතුර,
තෙල්ලිප්පළේ.

EOG 12-0177

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: TN/DS/LA/ACQ/ AY/2019/01.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/10/2018/D/403.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

| | |
|---|---|
| මූලික පිඹුර අංකය : | යා 3007 |
| ගම | කොඩිකාමම් |
| ග්‍රාම නිලධාරි කොටස | කොඩිකාමම් උතුර |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තෙන්මරාඩ්චි |
| දිස්ත්‍රික්කය | යාපනය |
| පළාත | උතුර |

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වෙච්චිකාඩු ; ඉඩම් විස්තරය: තාවකාලික ගොඩනැගිල්ල සහ වත්ත; හිමිකම් පාන්නාගේ නම:නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර 0.0148.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: වෙච්චිකාඩු සහ වෙච්චිතොඩ්ඩම් ; ඉඩම් විස්තරය: වත්ත දෙකක් අඩංගු වේ, තාවකාලික ගොඩනැගිල්ල; හිමිකම් පාන්නාගේ නම:සින්නන්තුරෙ යර්සලින්; ප්‍රමාණය: හෙක්ටයාර 0.2553.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.01.04 වැනි දින පෙ.ව. 10.00 ට තෙන්මරාඩ්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022.12.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම /පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. උෂා,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තෙන්මරාඩ්චි

2022 දෙසැම්බර් මස,
තෙන්මරාඩ්චි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

EOG 12-0182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.